ශ්‍රී ලංකාවේ පහ වසර ශිෂ්‍යයන්ගේ සිංහල භාෂා අවබෝධ හැකියාව කෙරේ බලපාන සාධක විමසා බැලීම ( කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන අධ්‍යාපන කොට්ඨාසයේ තෝරා ගත් පාසල් තියැදියක් ඇසුරින් ).

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය.

එම්.පිල්/03.

[illegible]. දහනායක.

93/95

UCLIB
471322

## සංක්ෂිප්තය

ජාතික සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය

නිර්මාණ කුසලතාවෙන් යුක්ත කාර්යක්ෂම පුද්ගලයන් පාසල තුළින් බිහිකිරීම අධ්‍යාපනය තුළින් සිදු විය යුත්තකි. ද්විතීයික අධ්‍යාපන අදියරට පිවිසෙන සිසුන්ගේ භාෂා දක්ෂතා දියුණු කිරීම මේ සඳහා අවශ්‍ය ම වන දෙයකි. සමාජය හා දැනුම ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයට ශිෂ්‍යයා හැඩ ගැසෙන්නටත්, දැනුම රැස්කර ගැනීමටත් , අදහස් ප්‍රකාශනයටත් , සංකල්ප නිර්මාණයටත්, අධ්‍යාපන මාධ්‍යය වූ මව්බස අත්‍යවශ්‍ය ය. ප්‍රාථමික අදියර අවසන් කරන සිසුන්ට භාෂාවේ චතුරවිධ කුසලතා පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. අවබෝධයෙන් යුතුව යමක් කියවා තේරුම් ගැනීමට සමත් සිසුන් බොහෝ වශයෙන් අද පන්ති කාමරවල අඩු ය. අධ්‍යාපනයේදී පසු බසින මෙබඳු ශිෂ්‍යයන් පන්ති කාමරයට ගැටළුව කි.

පහ වසර ශිෂ්‍යයන්ගේ භාෂා අවබෝධ හැකියා කෙරේ පාසල් වර්ගය, ගුරුවරුන්ගේ පුහුණු නුපුහුණු බව, ගුරුවරුන් පන්ති කාමරයේ ඉගෙනුම් අත්දැකීම් දීමේ ස්වභාවය, දෙමව්පියන්ගේ උගත්කම, දෙමාපියන්ගේ සමාජ ආර්ථික පරිසරයේ බලපෑම, අධ්‍යයනය කර පහ වසර ශිෂ්‍යයන්ගේ භාෂා අවබෝධ හැකියාව දියුණු කරවීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග අනාවරණය කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

අධ්‍යාපනය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන කොට්ඨාසයට අයත් පාසල් වලින් ස්ථරායත අහඹු නියැදිකරණයට පාසල් 14 ක් තෝරා ගන්නා ලදී. පාසලකින් පන්ති 1 ක් බැගින් ශිෂ්‍යයන් 402 ක් ශිෂ්‍ය නියැදියට ඇතුළත් විය. පහ වසර විෂය නිර්දේශයට අයත් අරමුණු 8 ක් ඇතුළත් කර පිළියෙල කරගත් සාධන පරීක්ෂණය ශිෂ්‍ය නියැදියට ඉදිරිපත් කෙරිනි.

University of Colombo
Library

එම සිසු නියැදියට ඉදිරිපත් කෙරුණු පංතිවල පංතිභාර ගුරුවරු 14 දෙනෙක්ද, එම පාසල්වලින් අමතර තවත් පහ වසර පංති භාර ගුරුවරු 4 දෙනෙක්ද, ගුරු නියැදියට ඇතුළත් වූහ. ශිෂ්‍ය නියැදියට අයත් සියලුම දෙමාපියන්ට ද ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර සමාජ ආර්ථික පරිසරය දරුවන්ගේ භාෂාව කෙරේ බලපෑම විමසන ලදී.

නියැදියට අයත් සියලුම පාසල්වල සම්මත කරගත් පංති කාමර නිරීක්ෂණ පත්‍රිකාවකට අනුව පහ වසර එක පංතියක් බැගින් නිරීක්ෂණය කරන ලදී. එමගින් පංති කාමරවල ගුරුවරුන් භාෂා පාඩම් මගින් ඉගෙනුම් අත්දැකීම් දෙන ආකාරය විමසන ලදී. ගුරුවරුන්ට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියෙන් සිසුන්ට වඩාත් දුර්වල භාෂා සංකල්ප හා එයට බලපාන හේතු විමර්ශනය කරන ලදී.

1ඒබී, 1සී, 2, හා 3 වර්ගයේ පාසල් සියුත් අතරින් 1 ඒබී පාසල් භාෂා අවබෝධ හැකියාවේ දී සතුටුදායක මට්ටමක් පෙන්වා ඇත. ගුරුවරයාගේ පුහුණු නුපුහුණු භාවය, ඒකාකාරී ඉගැන්වීම් ක්‍රම නිසා ශිෂ්‍යයාගේ භාෂාව සම්බන්ධයෙන් වෙනසක් නොවී ය. ගුරුවරයා ඒකාකාරී ලෙසම, සිංහල පාඩම් පංති කාමරය තුළ ඉගැන්වීම පෙනී ගිය කරුණකි. බොහෝ ගුරුවරුන් පෙර සූදානමක් නැතිව පාඩම් උගන්වන බව පැහැදිලි වුනි.

දෙමාපියන්ගේ උගත්කම ශිෂ්‍යයාගේ භාෂා අවබෝධය සම්බන්ධව බලපෑම් කරන බවත්, දෙමාපියන්ගේ සමාජ ආර්ථික පරිසරය ද ශිෂ්‍යයාගේ භාෂා අවබෝධය සම්බන්ධයෙන් බලපාන බව පැහැදිලි විය.

පංතිවල ඉගැන්වීම නිරීක්ෂණය කිරීමෙන් ද, ගුරුවරුන්ට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියට දුන් ප්‍රතිචාර අනුව ද, භාෂා අවබෝධ හැකියාවට බලපාන සාධක ඒවා මගහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි විය.

ඒ අනුව නිගමන පදනම් කරගෙන ගතයුතු ක්‍රියාමාර්ග යෝජනා කර ඇති අතර නුදුරු අනාගතයේ දී දියත් කළයුතු පර්යේෂණ පිළිබඳව ද සඳහන් කර ඇත.